# මියගිය කේ. ගුණරත්නම් මහතාගේ 30 වන ගුණානුස්මරණය

**1983 අගෝස්තු මස 09 වන දින නොහඳුනන තුවක්කුකරුවන් විසින් ඝාතනය කරන ලද යාපනයේ කේ. ගුණරත්නම් මහතාගේ 30 වන ගුණානුස්මරණය කිරීම.**



1982 දී මා විසින් *(වමේ)* පවත්වන ලද පිළිගැනීමේ උත්සවයකදී මියගිය කේ. ගුණරත්නම් මහතා *(මැද)* සහ මියගිය **N.G.P.** පණ්ඩිතරත්න මහතා *(දකුණේ)*

**"K.G"** යනුවෙන් ජනප්‍රියව සිටි කේ. ගුණරත්නම් මහතා යාපනයේදී සාමාන්‍යය තැනැත්තෙකු වූ අතර කොළඹදී ව්‍යාපාර කටයුතු අරඹන ලදී. මට ඔහු දැන හැඳින ගැනිමට හැකි වූයේ 1974 වර්ෂයේදී ය. ඔහුගේ පුත්‍රයා වූ **G.R.** පද්මරාජ් විසින් ඔහුගේ පියා මට හඳුන්වා දෙන ලදී. කේ. ගුණරත්නම් මහතාගේ ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධවන ලෙස ඔහු මගෙන් ඉල්ලා සිටියේය. අර්ධකාලින කළමනාකාර උපදේශකයෙකු ලෙස මගේ සේවය ලබාදිමට 1974 අගෝස්තු මාසයේදී මම එකඟ වුනෙමි. ඔහු මට කාමරයක් ලබාදුන් අතර වැඩ සම්බන්ධීකරණය සඳහා ලේකම්වරියක්ද ලබාදෙන ලදි. මා සෘජුවම ඔහුට වගකිවයුතු වූ අතර ඔහුගේ ව්‍යාපාරයේ සියළු විධායකයන්ට ඒ බව දැනුම්දෙන ලදි. මා බොහෝ දුරට සභාපති කේ. ගුණරත්නම් මහතාගේ විධායක උපදේශකයෙකු ලෙස ක්‍රියා කලෙමි.

ඔහු විදේශගත වූ දිනවලදී හැර, දිනපතා ඔහු දිවා ආහාරයට යැමට පෙර සවස්වරුවේ ඔහු හමුවිමට යාම මට පුරුද්දක්ව තිබුණි. ඔහුට සවස් කාලයේ කෙටි නින්දක් ගැනිමේ පුරුද්දක් විය. කවර හෝ හේතුවක් නිසා ඔහු නිදා සිටින විට ඔහුගේ නින්දට බාධා වන පරිදි කටයුතු නොකරන ලෙසට ඔහු උපදෙස්දී තිබිණි. ඔහු සවස් කාලයේ විවිධ තැනැත්තන් හමු වූ අතර ඒ අනුව මිතුරු සබඳතා සහ ව්‍යාපාර සබඳතා ඇති කරගන්නා ලදි.

සිනමා කර්මාන්තයේ ව්‍යාපාර කටයුතු ආරම්භ කළ ඔහු ශ්‍රී ලංකාවේ ඉතා සාර්ථක චිත්‍රපටි නිෂ්පාදක බෙදා හරින්නා සහ දිවයින පුරා සිනමාශාලා රාශියක අයිතිකරුද විය. ඔහු විසින් සිංහල චිත්‍රපටි කර්මාන්තයේ ප්‍රවීනයන් කිහිපදෙනෙකු බිහිකල අතර ඊට එඩී ජයමාන්න, රුක්මනී දේවි, ආනන්ද ජයරත්න, සන්ධ්‍යා කුමාරි ප්‍රවීනයෙකු වූ ගාමිණී ෆොන්සේකා ද ඊට ඇතුළත් විය. ඔහුගේ ඉතා ජනප්‍රිය නිෂ්පාදනයක් වුයේ "සංදේශය" චිත්‍රපටියයි. ඉතා ජනප්‍රිය ගීතයක් වූ "පුරුතුගිසිකාරයා" නම් වූ සිංදුව එම චිත්‍රපටියට ඇතුළත් වූ ගීතයක් විය. එම චිත්‍රපටිය මගින් ලෙස්ටර් ජේම්ස් පීරිස් අධ්‍යක්ෂවරයෙකු ලෙස නමක් ගත් අතර "පුරුතුගිසි කාරයා" නම් වූ සිංදුව සමග අරිසෙන් අහුබුදු ප්‍රසිද්ධියට පත් විය.

සිංහල චිත්‍රපටි කර්මාන්තය වැඩි දියුණු කරමින් කේ. ගුණරත්නම් මහතා විසින් සිංහල චිත්‍රපටි 25 කට වැඩි ප්‍රමාණයක් නිපදවන ලැබී ය.

ඔහු නිපදනු චිත්‍රපටි කිහිපයක් වුයේ "සුජාතා", "වරද කාගෙද", "රදළ පිළිරුව", "දුප්පතාගේ දුක", "වන මෝහිණි", "සූරයා", "වීර විජය", " ධීවරයෝ", "අල්ලපු ගෙදර", "චණ්ඩියා", "ඔබ දුටුදා", "අටවෙන පුදුමය", " ලක්ෂෙට කොඩිය", " ආත්මපුජා", "හොඳයි නරකයි", "සංදේශය" වේ. මෙම චිත්‍රපටිවලින් ඇතැම් චිත්‍රපටි 1983 ජුලි කලබලවලදි විනාශ වී ඇති අතර වර්තමාන පරපුරට ඒවා නැරඹිමේ අවස්ථාව අහිමි වී ඇත.

කේ. ගුණරත්නම් මහතා කර්මාන්ත ක්ෂේත්‍රයටද අතගැසු අතර බෝල් පොයින්ට් පෑන්, රැලි සහිත තහඩු, ප්ලාස්ටික් කන්ටේනර් ඔහුගේ නිෂ්පාදන වු අතර ඔහුට අයත් නවීනතම රෙදි විවිමේ මධ්‍යස්ථානයක් ජාඇල පිහිටා තිබුණි. එහි රෙදි විවිමේ උපකරණ (Spindles) 24,000 සවිකර තිබු අතර ජල ජෙට් රෙදිවියන යන්ත්‍ර 200 ක්ද සවිකර තිබුණි. 1983 ජුනි මාසයේදි මෙවැනි රෙදි වියන යන්ත්‍ර 100ක් ආනයනය කර හැඳග කර්මාන්ත සංකිර්ණයේ තාවකාලිකව ගබඩා කර තිබුණි. එසේ ගබඩා කර තිබුණේ 1983 අගෝස්තු මාසයේදි විදේශිය ඉංජිනේරුවන් පැමිණ ජා ඇල රෙදි විවිමේ මධ්‍යස්ථානයේ ඒවා සවිකරන තුරු ය. හැඳල කර්මාන්ත සංකිර්ණය තුළ චිත්‍රපටි නිපදවනු ලැබු විජය චිත්‍රාගාරය පිහිටා තිබුණි. ඊට අමතරව කොළඹ 5 කිරුල පාරේ, චිත්‍රාගාර පහසුකම් තිබුණි.

කොරුගේටඩ් කාබන් , ප්ලාස්ටික් කන්ටේනර් සහ බෝල් පොයින්ට් පෑන් නිපදවු කර්මාන්තශාලා හැඳල කර්මාන්ත සංකිර්ණයක් පිහිටුවා තිබු අතර සම්ප්‍රදායික ප්‍රධාන කාර්යාලය කොළඹ 10, සඟරාජ මාවතේ පිහිටා තිබුණි. එහි මුද්‍රණාලයක්ද තිබුණි. මුල් සිනමාස් ප්‍රධාන කාර්යාලය කොළඹ 13 නව හෙට්ටි විදියේ පිහිටා තිබුණි.

කඩදාසි රිල් සහ ප්ලාස්ටික් ග්‍රැනියුල් විශාල ප්‍රමාණයක් හැඳල කර්මාන්ත සංකිර්ණයේ ගබඩා කර තිබුණි. 1983 කළු ජුලිය සිදු වුදින රාත්‍රියේ කේ ගුණරත්නම් මහතා බුලර්ස් පාරේ තම සුඛෝපභෝගි නවසේ සිටි අතර චණ්ඩින් විශාල පිරිසක් පැමිණ ඔහුව එම නිවසින් පළවා හරින ලදි. ඔවුන්ට නිවස ගිනිතැබිමට නොහැකි විය. කේ ගුණරත්නම් මහතා හෝලිඩේ ඉන් හෝටලයේ අධ්‍යක්ෂවරයෙකු වු අතර ඔහු එම හෝටලයේ සම්පූර්ණ මහළත් බදුගෙන එහි නැවති සිටියේය. 1983 ජුලි මස 30 වන දින ඔහුගේ උපන් දිනය වු අතර ඇඳිරි නිති අවසර පත්‍රයක් ලබාගෙන මම ඔහු බැලිමට එම හෝටලයට ගියෙමි. ඔහු එම ස්ථානයේදි වැළපෙමින් සිටිය හ.

හැඳළ කර්මාන්ත සංකිර්ණය ගිනි තබනු ලැබු අතර සති දෙකක් ගින්න පැවතුණි. කඩදාසි රිල් තොග සහ ප්ලාස්ටික් ග්‍රැනිවුල් විනාශ විය. රෙදි විවිමේ යන්ත්‍ර 100 පමණ විනාශ විය. ඒවාට රක්ෂණයක් නොතිබුණි. ඒවා ජා ඇල රෙදි මධ්‍යස්ථානයේ සවි කිරිමට තිබිණ ඒවා ය. කේ. ගුණරත්නම් මහතාට සිද වු අලාභය රුපියල් මිලියන 200 පමණ වන අතර 1983 ජුලි කලබලයෙන් පසු ඔහු බාන්ස් පෙදෙසේ කුඩා නිවසක පදිංචියට ගියේ ය.

කේ. ගුණරත්නම් මහතා ටවර්හෝල් රඟහලේ ප්‍රධාන අයිතිකරු විය. එය කලින් හඳුන්වනු ලැබුවේ "Tower talkies" යන නමිනි. එම රඟහල මගින් සිංහල නාට්‍ය කලාව සහ කලා ශිල්පීන් දියුණු විය. ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතා ටවර් රඟහල රජයට පවරා ගැනිමට ඉල්ලා සිටි විට කේ ගුණරත්නම් මහතා කිසි පැකිලිමකින් තොරව ඊට එකඟ වී එය රජයට පවරා දුන්නේ ය. අද එම ස්ථානය "ටවර් හෝල් රඟමඩල" ලෙස දියුණු වි ඇතත් කේ ගුණරත්නම් මහතාගේ මිල කල නොහැකි පරිත්‍යාගය ගැන කිසිඳු සඳහනක් නැත. ඇත්ත වශයෙන් එය ඔහුගේ නමින් නම්කළ යුතු ය.

ආර්. ප්‍රේමදාස මහතා යාපනයට ගිය ඓතිහාසික ගමනේදි කේ. ගුණරත්නම් මහතාද යාපනයට ගිය අතර මමද ඔහු සමග ගියෙමි. කේ. ගුණරත්නම් මහතා විසින් වෙලිංටන් සිනමාහලේ සේවකයන් යොදවා යාපනය පුරා පෝස්ටර් ගස්වල සවිකර තිබුණි. ප්‍රේමදාස මහතා යාපනයේ පලාලි ගුවන් තොටුපලට පැමිණෙන විට ඔහුව උණුසම් ලෙස පිළිගැනිමක් ලබාදිමට කේ. ගුණරත්නම් මහතා කටයුතු කලේ ය.

මා විවාහ වු විට කේ. ගුණරත්නම් මහතාගේ බිරිඳ විසින් යපනයේදි ඔහුගේ නිවසේ දි විශාල සංග්‍රහයක් පවත්වන ලදි. යාපනයේ ව්‍යාපාරික ප්‍රජාවට ඊට ආරාධනය කර තිබුණි. මහජනයා සම්බන්ධයෙන් කටයුතු කළ යුත්තේ කෙසේද යන්න මා ඉගෙන ගත්තේ කේ ගුණරත්නම් මහතාගෙනි. මා වෘත්තිය අධ්‍යාපනයක් ලැබු දැනුමට වඩා කේ ගුණරත්නම් මහතාගේ දැනම හා පළපුරුද්ද ඉතා වටිනා දෙයක් විය.

අනෙක් අතර කේ ගුණරත්නම් මහතා විනෝද කටයුතු පිලිබඳ උනන්දුවක් දැක්වූ අයෙකු වන අතර තයිපොන්ගල් දින රාත්‍රියේදි බුලර්ස් පාරේ ඔහුගේ සුඛෝපභෝගි නිවසේදි ඔහු සමග කටයුතු කළ පුද්ගලයන්ට විශාල සාදයක් පැවැත්විය. ඔහු දේශපාලනඥයන් ඇසුරු කළ අතර ඒට හියු ප්‍රනාන්දු , මෛත්‍රිපාල සේනානායක , ටී බි ඉලංගරත්න සහ රත්වත්ත පවුලේ අය ඇතුළත් විය. සිලෝන් තියටර්ස් සමාගමේ ඇල්බට් පේජ් (page) මහතා ගුණරත්නම් මහතාගේ තරඟකරුවෙකු වු නමුත් ඉතා කුළුපග මිතුරෙකු විය. ඔවුන් නිතිපතා 4 දෙනෙකුගේ හෝ 5 දෙනෙකු සහිතව සාද පැවැත්වූ අතර මමද ඉන් එක් අයෙකු විය.

1989 අගෝස්තු 9 වන දින ඔහුට දෛවෝපගත දිනයක් වු අතර එදින පස්වරු 1.00 ට පමණ ඔහු මට දුරකථන ඇමතුමක් ලබාදි කථා බහ කල අතර මා දින කිහිපයකට එක්සත් රාජධානිය බලා යන බව ඔහුට දැනුම් දුන්නේ ය. මා මගේ මිතුරෙකු සමග දිවා ආහාරය ගැනිමට ගිය අතර මගේ කාර්යාලයෙන් මට දුරකථන ඇමතුමක් ලබාදි ප්‍රකාශ කර සිටියේ කේ. ගුණරත්නම් මහතා මියගොස් ඇති බවය. වසර කිහිපයකට පෙර එංගලන්තයේදි හෘදය ශෛල්‍ය කර්මයක් කර තිබු නිසා ගුණරත්නම් මහතා ස්වභාවික හේතුවක් නිසා මිය යන්නට ඇතැයි මට සිතුණි.

කෙසේ වුවද මා ඔහුගේ ලේකම්වරියට දුරකථන ඇමතුමක් ලබාදුන් විට ඇය ප්‍රකාශ කලේ ඔහුට වෙඩි තබා ඇති බවය. මා මගේ එංගලන්ත ගමන අවලංගු කර ඔහුගේ පුත්‍රයා වු G.R.පද්මරාජ්ට ඇමතුමක් ලබාදුනි. ඉන්පසු ඔහුගේ මෘතදේශය ලබා ගැනිමට මෘත ශරිරාගාරයට ගියෙමි. එය මට ඉතා කනගාටුදායක දිනයක් විය. ගුණරත්නම් මහතා කාර්යාලයේ සිට මෝටර් රථයකින් පැමිණෙන විට මෝටර් සයිකලයකින් පැමිණි දෙදෙනකු විසින් ඔහුට වෙඩිතබා ඇති බව දැන ගන්නට ලැබුණි. ඔහුගේ රියදුරුට වෙඩි තැබිමට තුවක්කුකරුවන් උත්සාහ කර ඇති නමුත් එය ව්‍යර්ථක වි ඇත. ගුණරත්නම් මහතා රෝහලට ගෙනයාමට රියදරුට හැකි වි ඇති නමුත් එහිදි ඔහු මියගොස් ඇති බව දැන ගන්නට ලැබුණි.

කේ ගුණරත්නම් මහතා අවසන් දුරකථන ඇමතුම ලබාදි ඇත්තේ මට නිසා මා කවුද යන්න පිලිබඳව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විමසා ඇති බව ගුණරත්න මහතාගේ ලේකම්වරිය මට දන්වා සිටියා.

1989 භයංකර කාලසිමාවක් වු අතර ඔහු සහ වෙනත් පුද්ගලයන් මරා දැම්මෙන් පසුවද මෙම තත්වය දිගටම පැවතුණි. ගාමිණි ෆොන්සේකා සහ මම අවසන් කටයුතු සංවිධානය කළ අතර මගේ කාර්යාලයේ සිට කමිටුවක් මගින් එම කටයුතු ඉටු කලේ ය. අවමගුල් පෙරහැරේදි ගාමිණි සහ මම සහ ගුණරත්නම් මහතාගේ පුතුන් දෙදෙනා දේහය අසලින්ම ගමන් ගත් අතර එසේ නොයන ලෙස අපට කිහිපදෙනෙකු අවවාද කළහ. ජා ඇල රෙදි කම්හලේ ගේටුව අසල තවත් කිප දෙනෙකුගේ මෘත ශරිර තිබුණි. සිංහල සිනමා කර්මාන්තයට කලාශිල්පින්ට හා ජනතාවට රැකියා සැපයිම මගින් මහජනතාවට විශාල සේවක් කල ඔහු සාපරාධි ලෙස මරා දමන ලදි.

1983 ජුලි කලබලයට වගකිව යුතු පුද්ගලයන් හා 1989 බිහිසුණු මිණිමැරිම්වලට වගකිව යුතු පුද්ගලයන් නිතිය ඉදිරියට පමුණුවනු නොලැබු අතර ඔවුන් මහජනතාවට කල අලාභහානිවලට මහජනතාවගෙන් සමාව ඉල්ලා නැත. ඒ අනුව මේ රටේ සංවර්ධනය හා දියුණුව වෙනත් අතකට හැරි ඇත.

***නිහාල් ශ්‍රී අමරසේකර***